# කෘෂි ව්‍යාපාර සංවර්ධනය:

## කල යුත්තේ කුමක්ද?

## කෘෂි ව්‍යාපාර පද්ධතිය

යෙදැවුම් සම්පාදනය, ගොවිපළ වාණිජ නිෂ්පාදන, සැකසුම් සහ බෙදාහැරීම යන අතුරු අංශ තුනකින් කෘෂිව්‍යාපාර පද්ධතිය සමන්විත ය. යෙදැවුම් සම්පාදනය යන්නෙන් අදහස් කැරෙන්නේ කෘෂිව්‍යාපාරයෙහි ආර්ථික ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම්, ශ්‍රමය, යන්ත්‍රෝපකරණ, තාක්ෂණය, ජලය, සහ විදුලිබලය ආදී වූ අවශ්‍යතා සපයාගැනීමයි. වාණිජ අවශ්‍යතාවන් පෙරදැරි කරගෙන ක්‍රියාත්මක කැරෙන කෘෂිකාර්මික කටයුතු, ගොවිපළ වාණිජ නිෂ්පාදන යන්නෙන් අදහස් කැරෙයි. කෘෂිකර්මාන්තය ආශ්‍රයෙන් පාරිභෝගික ද්‍රව්‍ය නිෂ්පාදනය කර දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ බෙදාහැරීම, සැකසුම් සහ බෙදාහැරීම යනුවෙන් දක්වුණු අංශය සතු කාර්යයයි.

## කෘෂිව්‍යාපාරයෙහි අගය දාමය

කෘෂිකාර්මික වූත් ඉන් බාහිර වූත් ග්‍රාමීය සංවර්ධනය සඳහා දායක වන්නා වූ විවිධ ප්‍රලම්බිතයෝ ඉහත කී අතුරු අංශ නියෝජනය කරති. නිෂ්පාදන අදියරෙන් පටන් ගෙන පරිභෝජන අවස්ථාව දක්වා විහිදෙන අගය දාමය පුරා ම වූ යෙදැවුම් ද වගාකිරීම් ද අස්වනු නෙළීම් ද වර්ගීකරණය ද ගබඩාකරණය ද සැකසීම ද ඇසුරුම ද ප්‍රවාහනය ද පමණක් නොව බෙදාහැරීම ද ආදී වශයෙන් දක්වෙන විවිධ කාර්යයන් පසුකරන හැම අවස්ථාවක දී ම නිෂ්පාදිතයට අගය එකතු වීමක් සිදු වේ. කෘෂිව්‍යාපාර සංවර්ධනය ඉදිරියෙහි ඇති බාධාවන් හඳුනාගත හැකි වන්නේ ඉහත කී අගය දාමයෙහි ඇතුළත් සෑම අවස්ථාවක් ම වෙත අවධානය යොමු කිරීම තුළින් ය.

## කෘෂිව්‍යාපාරයෙහි තරගකාරී වර්ධනය

කිසියම් ව්‍යාපාරයක තරගකාරී වර්ධනය කෙරෙහි සාධක ගණනාවක් බලපායි. යෙදැවුම් තත්ත්වය, ඉල්ලුම් තත්ත්වය, සම්බන්ධිත හා ආධාරක ව්‍යාපාර, ආයතනික ක්‍රමෝපාය, ව්‍යුහය සහ තරගය ආදී වශයෙන් දක්වෙන සාධක ඒ අතර වේ. මෙකී ඕනෑ ම සාධකයක් හා සම්බන්ධව දැකිය හැකිව තිබෙන ඉහත කී අභියෝගයන් ලිහිල් කැරෙන හෝ වර්ධනය කැරෙන හෝ ආකාරයෙන් රජයට ක්‍රියා කළහැකි ය.

## ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාපාරය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්තයන් අනුව 2008 දී ශ්‍රී ලංකාව තුළ වූ කෘෂිව්‍යාපාර ඒකක 4725 න් බහුතරයක් පිහිටා තුබුණේ කෘෂිකාර්මික ප්‍රදේශයන් තුළ නොව බස්නාහිර පළාත තුළ ය. සමස්ත කෘෂිව්‍යාපාර ඒකක ප්‍රමාණයෙන් සියයට 32 ක් ද එම ක්ෂේත්‍රයේ රැකියාවන් ගෙන් සියයට 38 ක් ද බස්නාහිර පළාත තුළ සංකේන්ද්‍රණය වී තුබුණේ ය. මෙම ක්ෂේත්‍රයේ සමස්ත අගය එකතු කිරීම්වලින් සියයට 74 ක දායකත්වයක් සැපයූ බස්නාහිර පළාත රටෙහි සෙසු පළාත් හා සැසඳීමේ දී වැඩි ඵලදායීත්වයක් පෙන්වයි. කෘෂිව්‍යාපාර ඒකකයන් ගෙන් සියයට 72 ක් ම 20 නොඉක්මවන සේවක සංඛ්‍යාවක් සහිතව ක්‍රියාත්මක වන ඒවා වන හෙයින් කෘෂිව්‍යාපාර ක්ෂේත්‍රය මුල් ක්‍රියාත්මක කරනු ලබන්නේ කුඩා ආයතනයන් විසින් බව කිව යුතු ය.

කෘෂි කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් හි වර්ධනයක් ඉකුත් වසර කීපය තුළ දක්නට ලැබුණු අතර 2008 දී එය සමස්ත අපනයන ප්‍රමාණයෙන් සියයට 23 ක් වී ය. කෘෂි කර්මාන්තය ආශ්‍රිත අපනයනයන් ගෙන් හරි අඩක් ම මෙන් සපුරා ලන ලද්දේ තේ අපනයනයන් විසිනි. තේ අපනයනයන් විසින් සපයන ලද එකී දායකත්වය 1995 න් පසු එළැඹි කාලය පුරා නොවෙනස් ව පැවැතීමෙන් පෙනී යන්නේ කෘෂි කර්මාන්තය ආශ්‍රිත සෙසු අපනයනයන් හි සැලකිය යුතු වර්ධනයක් එම කාලය තුළ සිදු වී නැති බව ය. සාම්ප්‍රදායික තේ කර්මාන්තය අභිබවා යාමේ හැකියාවක් කෘෂි කර්මාන්තය ආශ්‍රිත සෙසු අපනයනයන් සතුව තිබී නැති බව මෙයින් පැහැදිලි වන්නේ ය.

## සාම්ප්‍රදායික කෘෂිව්‍යාපාර ප්‍රතිපත්ති

සාම්ප්‍රදායික කෘෂි ප්‍රතිපත්තීන් සමුදායකට උරුමකම් කියන ශ්‍රී ලංකාව තුළ පසුගිය දශක කීපය මුළුල්ලේ පැවැති විවිධ රජයන් විසින් ක්‍රියාවට නංවන ලද කෘෂි ප්‍රතිපත්තීන් මෙන් ම වැඩසටහන් ද බොහෝ වී ය. සහතික මිල ක්‍රම ද පොහොර සහ කම්හල් නවීකරණ සහනාධාර ද සහනදායී ණය ද ඉදිරි විකුණුම් විධිවිධානයන් ද රජයේ වී මිලට ගැනීමේ ව්‍යාපාරයන් ද නිදහස් වාරි ක්‍රම ද රජයේ පර්යේෂණ සහ සංවර්ධනයන් ද රජයේ ව්‍යාප්ති සේවාවන් ද අපනයන ප්‍රවර්ධන සහ ආනයන පාලන යන දෙඅංශයේ ම උපකාරක වෙළෙඳ ප්‍රතිපත්තීන් ද ආදී වශයෙන් වූ බොහෝ දිරිගැන්වීම් ඒ අතර දක්නට ලැබිණි. ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, යම් යම් අලෙවි භෝග හා අගය ආකලිත නිෂ්පාදිතයන් හි ප්‍රවර්ධනය, ග්‍රාමීය යටිතල ප්‍රවර්ධනය , අලෙවිකරණ පහසුකම් වැඩි දියුණු කිරීම ආදී වූ පියවරයන් ද රජය විසින් ගනු ලැබ තිබේ.

සංවාද
SANVADA
சம்வாதம்

'POLICY BRIEF 18'

pathfinder Foundation

www.sanvada.org

## මහින්ද චින්තනයේ අවධානය

ග්‍රාමීය කෘෂිකර්මාන්ත සංවර්ධනය සඳහා රජය මැදිහත් වීමෙහිත් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා මෙන් ම ව්‍යාප්ති සේවාවන් සඳහා ද පෞද්ගලික අංශය සහභාගි කරවාගැනීමෙහිත් අවශ්‍යතාව විෂයෙහි රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වූ මහින්ද චින්තනය තුළින් අවධානය යොමු කරනු ලැබ තිබේ. දැනට යැපුම් මට්ටමෙහි පවතින කෘෂිකර්මාන්තය කෘෂි ආශ්‍රිත කර්මාන්තයන්ගේ ද සහභාගිත්වය ඇතිව වාණිජමය වශයෙන් ඵලදායී වූ ව්‍යාපාරයක් බවට පත් කර ලීමේ අපේක්ෂාව ද ඒ තුළ පවතී. වෙළෙඳපොළ අභිප්‍රායික මිලකිරීම් යාන්ත්‍රණයක සහ කෘෂිකර්මාන්ත අංශය දිරිගැන්වීම් ක්‍රමයක අවශ්‍යතාව පවතින බව ද තවදුරටත් රජය පිළිගනී. යම් යම් යෙදවුම් සඳහා සහනයන් ද භෝග අපනයන තරගය සඳහා ආරක්ෂාව ද අවශ්‍යව තිබෙන බව රජය තව දුරටත් පිළිගනී.

"පරිභෝජනය සඳහාත් කෘෂි ආශ්‍රිත කර්මාන්තයන්හි අවශ්‍යතාවන් සඳහාත් ලෝක වෙළෙඳපොළ වෙත වූ තරගකාරී අපනයනයන් හි යෙදීම සඳහාත් කාර්යක්ෂම ලෙස භාණ්ඩ නිෂ්පාදනයෙහි යෙදීම තුළින් ග්‍රාමීය ජීවනෝපායයන් නංවාලීම ද ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම ද කලාපීය වශයෙන් සාධාරණ ආර්ථික ප්‍රගතියක් සාක්ෂාත් කරගැනීම ද විෂයෙහි දායකත්වය සපයන කෘෂිකාර්මික අංශයක් ......"

**- මහින්ද චින්තනය**

ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ නියෝජිතායතනය (ICTA) විසින් ක්‍රියාත්මක කරන ලද ඊ-ශ්‍රී ලංකා වැඩසටහන වනාහි මෙරට කෘෂිව්‍යාපාරමය සංවර්ධනය සම්බන්ධයෙන් වඩාත් මෑත කාලීනව ක්‍රියාත්මක වූ තොරතුරු හා සන්නිවේදන වැඩසටහන වන්නේ ය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙහි ප්‍රතිලාභ සෑම ගමක්මත් සෑම පුරවැසියකුමත් සෑම ව්‍යාපාරයක්මත් වෙත රැගෙන යාම සහ රජයේ චින්තන හා කාර්ය රටාව නිසි මාර්ගයට යොමු කරවීම ICTA හි මෙහෙවරයි. අස්වැන්න ආරක්ෂා කර දීමත් නිෂේධාත්මක සිදුවීම් අවම කරගනිමින් ඉහළ අස්වැන්නක් ලැබීම පිණිස ඉවහල් වන්නා වූ කීටයන් හා පළිබෝධ පිළිබඳ තොරතුරු මෙන් ම නව භෝග වර්ග ඇතුළු වෙනත් කෘෂිකාර්මික තොරතුරු නිසි වේලාවට ගොවීන් වෙත ලබා දීමත් පිණිස අවශ්‍ය සැලසුම් ඊ-ශ්‍රී ලංකා විසින් සකස් කරනු ලැබ තිබේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඔස්සේ තත් කාලීන මිල ගණන් වෙත ප්‍රවේශ වීමේ හැකියාව හේතු කොටගෙන ඉහළ ආදායමක් ලැබීමටත් තවතවත් වෙළෙඳපොළ අවස්ථාවන් උදා කරගනිමින් පුළුල් සම්බන්ධතා ඇති කරගැනීමටත් පුළුවන්කම නිෂ්පාදකයනට ලැබේ. විකි ගොවියා සහ නව ගොවියා වැනි වැඩසටහන් යටතේ පරිගණකයන් හා ජංගම දුරකතනයන් තුළින් ජාල අඩවි වෙත පිවිස දේශීය භාෂාවන් භාවිතයෙන් එකී සේවාවන් ගේ ඵල නෙලා ගැනීමේ හැකියාව ගොවීන් වෙත ලැබේ.

## ගැටලු සහ ප්‍රතිපත්ති

මෙම ව්‍යාපාරයෙහි තරගකාරී වර්ධනය තීරණය කැරෙන සාධක පිළිබඳව කල්පනා කර බලන විට පෙනී යන්නේ මෙතෙක් අවධානයට පාත්‍ර නොවුණු බාධක හා අභියෝගයන් රාශියක් කෘෂිව්‍යාපාර අංශය ඉදිරියෙහි තිබෙන බව ය.

## සාධකයන් හි සංකීර්ණ භාවය

සාධකවල ස්වභාවය යන්නෙන් අදහස් කැරෙන්නේ ව්‍යාපාර කාර්යසාධනයට බලපාන්නා වූ නිෂ්පාදන සාධකයන් හා සම්බන්ධ ගැටලු ආදී තත්ත්වයන් වේ. ඉඩම් හිමිකමෙහි අවුල් සහගත තත්ත්වයන් ද බුක්තිය පිළිබඳ සංකීර්ණතාවන් ද යල් පිනූ ඉඩම් ප්‍රතිපත්තීන් ද ශ්‍රමය හා සම්බන්ධ ගැටලු ද සුළු පරිමාණ අස්වැන්න ද ආදී වශයෙන් වූ බාධාවන් රාශියක් කෘෂිව්‍යාපාර සංවර්ධනය ඉදිරියෙහි දක්නට තිබේ. මෙයට අමතරව භෝග වර්ග හිඟකම ද බාල තත්ත්වයේ බීජ සහ අමුද්‍රව්‍ය ද පර්යේෂණයන් හා සංවර්ධනයන් ක්‍රියාත්මක නොවීම ද වෙළෙඳපොළ අකාර්යක්ෂමතාව ද ව්‍යාපාර කාර්යසාධනය දුබල වීම කෙරෙහි බල පා ඇත. දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රතිපත්ති සම්පාදනයේ දී නිසි අවධානයක් යොමු නොවුණු මෙකී මූලික දුර්වලතාවන් ගෙන් ඇතැම් ඒවා දැන් පවතින්නේ මුල් බැසගත් තත්ත්වයක ය. ඉඩම් හිමිකම් රටාවන් ද බුක්ති ක්‍රම ද ඉඩම් ප්‍රතිපත්තීන් ද එසේ ම ශ්‍රමය ආශ්‍රිත ගැටලු ද විමර්ශනයට භාජන වීම දැන් අත්‍යවශ්‍ය වන්නේ ය. කෘෂිකර්මාන්තයටත් නිවාස අවශ්‍යතාවන්ටත් එසේ ම සංරක්ෂණයටත් වෙන් කළ යුතු ඉඩම් පැහැදිලිව හඳුනාගත් ඉඩම් පරිභෝජන සැලැස්මක් අනිවාර්යයෙන් ම අවශ්‍ය ය. සැපයුම් දාමයට දායක වන්නා වූ යාන්ත්‍රණයන් සහ සැකැසුමෙහි හා අලෙවිකරණයෙහි නිරත මහපරිමාණ කෘෂිව්‍යාපාරයන් සමඟ සුළු පරිමාණ ගොවීන් සම්බන්ධ කරවීමේ වැඩ පිළිවෙළවල් ඇති කිරීම මෙහි දී අතිශයින් වැදගත් වේ. රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතාව සහිතව හෝ වේවා, බුද්ධිමය දේපළ අයිතිය ද ලැබෙන ආකාරයෙන් පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් හි පෞද්ගලික අංශය නිරත කරවීමට පියවර ගත යුතුව තිබේ. ගුණත්වයකින් යුතු බීජ සහ පැළ සිටුවීමේ උපකරණ ලබාගැනීම පිණිස රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතාව ඇතිව පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල තව තවත් ආයෝජනයන් සිදු කළ යුතු ය.

## ඉල්ලුම විෂයෙහි වූ මන්දගාමී ප්‍රතිචාරය

ලෝක පරිභෝජන ප්‍රමුඛතාවන් ද සංවර්ධිත වෙළෙඳපොළ තත්ත්වයන් හි බලපෑම ද විසින් ඉල්ලුමෙහි ඇති කරනු ලැබ තිබෙන වෙනස්කම්වලට අනුරූපව ව්‍යාපාර අවශ්‍යතාවන් ගලපාගත යුතු ය. තොරතුරු ගලා යාමේ මන්දගාමී ස්වභාවය නිෂ්පාදකයන් ගේ පැත්තෙන් දක්නට ඇති අවහිරතාවක් වන අතර වෙළෙඳපොළ වෙනස් වීම්වලට අනුව ක්‍රියා කිරීමෙහි ලා සැපයුම් අංශයෙහි දක්නට ලැබෙන අනම්‍යතාවන් ද මෙහි දී මතු වන බාධාවන් ය. ලෝක පරිභෝජන ප්‍රමුඛතාවන් පවා වෙනස් කිරීමේ ශක්තිය සාර්ථක අලෙවිකරණ ක්‍රමෝපායයනට තිබෙන බව මෙහි දී අමතක නොකළ යුතු ය.

උපායශීලී නිර්මාණාත්මක භාවයකින් මෙන් ම අවිරෝධී මානසිකත්වයකින් ද යුතුව වෙළෙඳපොළ ප්‍රවනතාවන් විෂයෙහි ප්‍රතිචාර දැක්වීමේ හැකියාව නිෂ්පාදකයන් සතු විය යුතු ය. එහෙත් සුළු පරිමාණ නිෂ්පාදනයන් ද නිසි කලට තොරතුරු ගලා ඒමෙහි ඇති දුබලතාව ද හේතු කොටගෙන එසේ කටයුතු කිරිමට ඇති හැකියාවන් සීමා වෙයි. ඉඩම් අයිතීන් සහ ඉඩම් පරිහරණ ප්‍රතිපත්තීන් තුළින් සුළු පරිමාණ කෘෂිකර්මාන්ත පිළිබඳ ගැටලුව පිටුදැකීමේ හැකියාව කලකට පසුව උදා වෙතැයි සිතිය හැකි ය. සුළු පරිමාණ ගොවීන් සහ මහ පරිමාණ කෘෂිව්‍යාපාර ආයතන අතර ශක්තිමත් සම්බන්ධතාවක් ද ඒ සඳහා ඇති කරගත යුතු වන්නේ ය. තොරතුරු ප්‍රමාණවත්ව නොලැබීමේ ගැටලුව පිටුදැකීමේ අවශ්‍යතාව, අන්තර්ජාලය වෙත ප්‍රවේශ වීමේ හැකියාවන් වැඩි කිරීමත් ඒ ඔස්සේ ලබා දිය හැකි තොරතුරු ප්‍රමාණය ඉහළ නැංවීමත් මඟින් ඉටු කර ගතහැකි වනු ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ උපරිම ප්‍රතිලාභ කෘෂිව්‍යාපාරය වෙත ළඟා කර දිය හැකි වන පරිදි පරිගණක දැනුම ඉහළ මට්ටමකට නැංවීම ද එයට සමගාමීව කළ යුතු වන්නේ ය.

## දුබල උපකාරක ක්‍රියාවලිය

සම්බන්ධිත සහ උපකාරක ව්‍යාපාරයන් විසින් ව්‍යාපාර කාර්යසාධනය සඳහා අති විශාල මෙහෙවරක් ඉටු කරනු ලබයි. යටිතල පහසුකම් ද උපයෝගිතාවන් ද ප්‍රවාහනය ද තොරතුරු සැපයීම ද මූල්‍ය සේවාවන් ද ව්‍යාප්ති සේවාවන් ද ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු ද යනු ඒවායින් සමහරකි. මෙකී සාධකයන් ගේ ක්‍රියාකාරීත්වයෙහි පවතින දුබලතාවන් හේතු කොටගෙන අධික ගනුදෙනු පිරිවැයකට මුහුණ දීමට කෘෂිව්‍යාපාරයනට සිදු වී තිබේ. සැපයුම් දාමය සම්බන්ධීකරණයකින් තොරව ද දීර්ඝ ලෙස ද කොටස් වශයෙන් ද ක්‍රියාත්මක වීමෙහි ප්‍රඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවෙහි කෘෂි ව්‍යාපාරය පවතින්නේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක අතින් බොහෝ පහළ තත්ත්වයක ය.

කෘෂිව්‍යාපාරයෙහි ගනුදෙනු පිරිවැය අවම කරගනිමින් බස්නාහිර පළාතෙන් බැහැර කෘෂිව්‍යාපාර කටයුතු සඳහා වැඩිවැඩියෙන් ආයොජනය කිරීමට හැකි වන පරිදි කොළඹත් ග්‍රාමීය හා ප්‍රාදේශිය ආර්ථිකයනුත් අතර සම්බන්ධතා ගොඩනැංවෙන යටිතල පහසුකම්

වර්ධනය කළ විට සැපයුම් දාමයෙහි පවත්නා අවහිරතාවන් බොහොමයක් ඉවත් වී යනු ඇත. පිරිවැය සාඵල්‍යතා සහිත විකල්ප බලශක්ති උත්පාදන ක්‍රම වෙත ප්‍රවේශ වෙමින් බලශක්තිය බෙදාහැරීමේ හා පරිපාලනයේ කාර්යක්ෂමතාවන් ඉහළ නැංවීම ද වැදගත් අවශ්‍යතාවකි. දැනට රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාප්ති කටයුතු පෞද්ගලික අංශයට ද සහභාගි විය හැකි වන පරිදි විවෘත කළහොත් රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතාවකින් යුතුව හෝ තනිවම හෝ ව්‍යාප්ති හා ව්‍යාපාර සංවර්ධන කටයුතු වල නිරත වීමට පෞද්ගලික අංශයට ද හැකි වනු ඇත.

## රජයේ කාර්භාරය දිරිගන්වනසුලු ද? නැතහොත් බාධාකාරී ද?

රජයේ බලපෑම සහ ප්‍රතිපත්තිමය වටපිටාව හේතු කොටගෙන රාජ්‍ය පරිපාලනයේ හා නිලධර ක්‍රියාමාර්ගයන් ගේ අකාර්යක්ෂමතාව තුළින් ව්‍යාපාරයෙහි තරගකාරී ස්වභාවය ගිලිහී ගොස් ඇති බව පෙනේ. කෘෂිකාර්මික අංශය හා සම්බන්ධ වගකීම් භාර ගෙන කටයුතු කරන ජාතික මෙන් ම ප්‍රාදේශීය මට්ටම්වල රාජ්‍ය ආයතනයන් බොහෝ ගණනක් තිබේ. සාම්ප්‍රදායික රාජ්‍ය මැදිහත් වීම් ක්‍රම ඔස්සේ උපකාරක පියවර බොහෝ ගණනක් රජය විසින් ද ගනු ලැබ තිබෙන නමුදු කෘෂිව්‍යාපාර සංවර්ධනය පැත්තෙන් බලන විට ඒවායෙහි දක්නට ඇත්තේ සීමිත ඵලදායිත්වයක් සහ කාර්යක්ෂමතාවක් බව කිව යුතු ය.

අසීමිත රැකවරණයත් සහනාධාරත් විසින් ආර්ථිකයක යැපුම් කෘෂිකාර්මික ස්වභාවය හා ඉහළ නිෂ්පාදන පිරිවැය වෙනස් නොවන තත්ත්වයට පත් කරවන බැවින් තරගකාරී කෘෂිව්‍යාපාර අංශයක් වෙත අවතීර්ණ වීමේ ඉඩකඩ එම ආර්ථිකයට ඇවිරී යන්නේ ය. සුළු පරිමාණ හා විසුරුණු නිෂ්පාදන ඒකකයන් අලෙවිකරණය හා අදාළ බොහෝ කාර්ය සංවිධානමය ගැටලුවලට තුඩු දෙන අතර කෘෂිව්‍යාපාරයේ සංවර්ධනයට ද ඉන් බාධා සිදු වෙයි. පර්යේෂණ හා සංවර්ධන අංශයෙහි මෙන් ම ව්‍යාප්ති කටයුතු සම්බන්ධයෙන් ද පෞද්ගලික අංශය විසින් ඉටු කරනු ලබන්නේ කුඩා කාර්භාරයක් පමණක් වන අතර කෘෂිව්‍යාපාරසේ සංවර්ධනයට ප්‍රමාණවත් වන පරිදි කාර්යක්ෂම ලෙස ඵලදායී තොරතුරු ලබා දීමේ හැකියාව රජයෙන් සැපැයෙන අවම සම්පත් තුළින් පෞද්ගලික අංශයට ලැබෙන්නේ ද නැත. නිපුණ මානව සම්පත් හා කාර්සංවිධාන සම්පත්වලින් බොහොමයක් පවතින්නේ කෘෂිව්‍යාපාර අංශය හා අවම සම්බන්ධතා සහිත රජය යටතේ ය. විශ්ව විද්‍යාලයන් වැනි රජයේ සංවර්ධන හා පර්යේෂණ ආයතනයන් සමඟ වූ ව්‍යාපාරයේ සම්බන්ධතාවන් ද ඉතා දුබල ය. ඇත්ත වශයෙන් ම රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතාවන් ශ්‍රී ලංකාව තුළ විධිමත්ව නොපැවැත්වෙන අතර ඉතා සීමිත ප්‍රමාණයක් වූ එවැනි සම්බන්ධතාවන් ද පැවැත්වෙන්නේ පෞද්ගලික දැනහැඳුනුම්කම් පදනම් කරගෙන ය.

රාජ්‍ය අංශයේ ආයතන සංඛ්‍යාව බොහෝ දුරට අඩු කරමින් පරිපාලන හා කාර්යාල ක්‍රියාවලිය තුළ සරල හා සාධාරණ භාවය ඇති කළහොත් කෘෂිව්‍යාපාර ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව වර්ධනය කළ හැකි වනු ඇත. සහනාධාර ලබා දීම දිගින් දිගට ක්‍රියාත්මක වුවහොත් අකාර්යක්ෂමතාව ද දිගින් දිගට පවතිනු ඇතැයි පෙනී ගොස් තිබෙන හෙයින් ප්‍රවර්තන සහනාධාර වැඩ පිළිවෙළෙහි සහ වෙනත් දිරිගැන්වීම්වල ප්‍රතිලාභ පිළිබඳ සමීක්ෂණයක අවශ්‍යතාව දැන් මතු වී තිබේ. රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතාව වර්ධනය වුවහොත් සිය මානව සම්පත් සහ කාර්ය සංවිධානයන් කෘෂිව්‍යාපාරයේ ප්‍රවර්ධනය සඳහා යොමු කරවීමේ හැකියාව ද රජයට ලැබෙනු ඇත. රාජ්‍ය අංශයේ අදාළ ආයතනයන් ගේ ද සහයෝගය ඇතිව පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වෙතට පෞද්ගලික අංශය යොමු කරවාගැනීම ද ඉහත ප්‍රවේශය ඔස්සේ ඉටු කරගත හැකි ය.

## බුද්ධිමය දේපළ සහ ප්‍රවේණිමය ගැටලු

ජෛව විවිධාංගයන් අතින් අප ඉතා පොහොසත් බවට පුරසාසම් කිව හැකි වුවත් එහි නිසි ප්‍රතිඵල නෙලාගැනීමට අප මෙතෙක් සමත් වී නැත. මෙරට බුද්ධිමය දේපළ නීතිය තුළින් කෘෂිකාර්මික නව සොයාගැනීම් සඳහා නිසි ආරක්ෂාව සැලසෙතැයි කිව නොහැකි ය.

ලොව සංවර්ධිත කෘෂිකාර්මික පරිචයන්ට ගැලපෙන ආකාරයේ නව නීති ක්‍රියාත්මක කිරීමටත් කෘෂිව්‍යාපාර ක්ෂේත්‍රයට අදාළ බුද්ධිමය දේපළ අයිතීන් ආක්ෂා කිරීමටත් හැකි වන පරිදි ප්‍රවර්තන නෛතික ආකෘතිය යාවත්කාලීන වීම අවශ්‍ය ය.

## නිගමනයන්

සාධකමය වශයෙන් ද සම්බන්ධිත හා උපකාරක කර්මාන්තයන් හා අදාළව ද එසේ ම ක්‍රමෝපාය, ව්‍යුහය සහ තරගකාරීත්වය පැත්තෙන් ද විවිධ වූ බාධාවන්ට ශ්‍රී ලංකාවේ කෘෂිව්‍යාපාරය මුහුණ දී සිටින බව මෙම අධ්‍යයනය තුළින් පැහැදිලි වේ. මෙයට අමතරව ආයතනික පරිචය මෙන් ම ප්‍රතිපත්තිමය පරිසරය ද කාර්යක්ෂමව සහ ඵලදායීව ඉදිරියට ගමන් කිරීමෙහි ලා කෘෂිව්‍යාපාරයට හිතකර ලෙස සකස් වී නැත. ලෝක වෙළෙඳපොළෙහි ඉල්ලුම් ප්‍රවනතාවන් ශ්‍රී ලංකාවෙහි කෘෂිව්‍යාපාරයේ ඉදිරිගමනට හිතකරව සකස් වන බව පෙනෙන නමුදු, මෙරට අභ්‍යන්තර සාධකයන් ක්‍රියාත්මක වන්නේ ඊට බාධා ඇති කරන ආකාරයෙනි. කෘෂිව්‍යාපාරයේ වර්ධනයට බලපාන්නා වූ සාධක හතරට ගැලපෙන සේ තැබිය යුතු ප්‍රතිපත්තිමය පියවර ගණනාවක් මෙම අධ්‍යයනය මතු කර පෙන්වයි. කෘෂිව්‍යාපාරයේ ඉදිරිගමනට බලපාන්නා වූ අවහිරතාවන් ගෙන් බොහොමයකට සාම්ප්‍රදායික කෘෂකාර්මික ක්‍රමයේ මූලික දුර්වලතාවන් මෙන් ම ප්‍රතිපත්ති සම්පාදනයෙහි දක්නට ඇති මන්දෝත්සාහී භාවය ද බලපා තිබෙන බැවින් කෘෂිව්‍යාපාරය සාර්ථකත්වය කරා රැගෙන යාමට නම් මේ සියල්ල සමස්ත වෙනසකට භාජන කළ යුතු වන්නේ ය. කෘෂිව්‍යාපාරයේ ඉදිරිගමනට සිදු වන බාධාවන් නොතකා දිරිගැන්වීම්, සහනාධාර, සහ සංරක්ෂණයන් ඔස්සේ කෘෂිකර්මාන්තය යැපුම් මට්ටමේ පවත්වාගෙන යාමේ අවශයතාවට කොටු වී සිටින කවර රජයකට වුව ද මෙය අභියෝගයක් වන්නේ ය.

## කර්තෘ

**ආචාර්ණී අනෝමා ආරියවර්ධන**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී අනෝමා ආරියවර්ධන මහත්මිය නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලයෙන් සිය ආචාර්ය උපාධිය ලබාගත්තා ය. කෘෂිව්‍යාපාරය සහ අලෙවිකරණය ඇ විශේෂඥතාවක් දක්වන විෂයයන් වේ. සුප්‍රකට පුවත්පත් හා සඟරා ගණනාවක් තුළින් ඇගේ ලේඛණයන් ප්‍රකාශයට පත් වී තිබේ.

**සංස්කරණ සහය: ප්‍රියංවදා හේරත්**


**"පාත්ෆයින්ඩර්" පදනම**

| | |
|---|---|
| දුරකථන අංකය | 2596281 |
| ෆැක්ස් අංකය | 2595894 |
| ඊමේල් | info@pathfinderfoundation.org |
| වෙබ් අඩවිය | www.sanvada.org / www.pathfinderfoundation.org |

**සංස්කරණ සහාය: අමීරා අරූස් මිය, ව්‍යාපෘති කළමනාකාරිණිය.**